

**පූජ්‍ය කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර හිමි**

**උපකුලපති**

**Ven. Kiriwaththuduwe Pragnasara Thero**

Vice Chancellor

**1959.02.02 - 1966.10.01**

## මානවශාස්ත්‍ර පීඨයෙන් උපකුලපති තනතුර හෙබවූවෝ

## කිරිවත්තුඩුවේ ධර්මකීර්ති ශ්‍රී ප්‍රඥාසාර නාහිමියෝ

මහාචාර්ය කුලතිලක කුමාරසිංහ

කැලණිය විශ්වවිද්‍යාලය, දිවයිනේ සෙසු විශ්වවිද්‍යාල අතර දීර්ඝ ඉතිහාසයක් හොබවන පැරණිතම විශ්වවිද්‍යාල දෙකෙන් එකකි. බටහිර ආකෘතියට අනුකූල ලෙස විශ්වවිද්‍යාලය ප්‍රතිනිර්මාණය වූයේ 1959 දී වුව ද - එහි මුල් අඩියර වූ පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ වූයේ ක්‍රි.ව. 1875 නොවැම්බර් මස 01 දින ය. එහි 1945 සිට 1959 දක්වා පරිවේණාධිපති ලෙස සේවය කළ සාහිත්‍ය සූරි, ආගම චක්‍රවර්ති, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය, උපාධ්‍යාය, පණ්ඩිත **කිරිවත්තුඩුවේ ධර්මකීර්ති ශ්‍රී ප්‍රඥාසාර** නාහිමියෝ - විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපතිවරයාණෝ වූහ. ඒ 1959 දී ය. 1965 වන තෙක් උන්වහන්සේ උපකුලපති තනතුර හෙබවූහ.

ක්‍රි.ව 1891 පෙබරවාරි මස 07 වන දින කිරිවත්තුඩුවේ උපත ලද ශ්‍රී ප්‍රඥාසාර හිමියන්ගේ ගිහි නම **අච්චිමද්දුමාගේ ජේම්ස් අමරසිංහය**. පියා **අච්චිමද්දුමාගේ ජෝන් අමරසිංහ අප්පුහාමි** ය. බෝපාගමගේ නොන්නෝනාහාමි මව ය. මුලින් ම සිය පියාණන් වෙතින් අකුරු කිය වූ ජේම්ස් අමරසිංහ අනතුරුව බෙලිගම්මන විද්‍යාවර්ධන පිරිවෙනට ඇතුළත් ව සිංහල, පාලි හා සංස්කෘත යන භාෂා අධ්‍යයනය කළේ ය. 1902 ජූනි මස 10 දා හුණුපිටියේ විජයසුන්දරාරාම විහාරස්ථානයේ දී පැවිදි බව ලැබීමෙන් පසුව ද විද්‍යාවර්ධන පිරිවෙනේ ම අධ්‍යාපනය හැදෑරුවේ ය. නාහිමියන්ගේ පැවිදි ආචාර්යපාදයාණන් වූයේ විද්‍යාලංකාර පිරිවෙනෙහි ආචාර්ය ධුරය හොබවමින් සිටි **ලුණුපොකුණේ ශ්‍රී ධර්මානන්ද** ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය. පැවිදි වෙද්දී උපාධ්‍යායයන් වහන්සේ ලෙස ක්‍රියා කරනු ලැබුයේ විද්‍යාලංකාර පරිවේණාධිපති කළුපලුවාවේ (රත්මලානේ) ශ්‍රී ධර්මාරාම ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි. 1911 දී මහනුවර ශ්‍රී උපෝසිත පුෂ්පාරාම සීමා මාලකයේ දී උපසම්පදාව